## සර්ධාර් පනික්කාර්ගේ සිහිනය සැබෑ කිරීම සඳහා... ශ්‍රී ලංකාව ඉන්දියාවේ 29 වැනි ප්‍රාන්තය බවට පත් කිරීම සඳහා .... ඊට පසුව 30 වැනි ප්‍රාන්තයත් බිහිකිරීම සඳහා....



# රනිල් වික්‍රමසිංහ චරිතයේ කැපවීම

**අගමැති ලෙස හත් වතාවක් සහ ජනාධිපති ලෙස එක් වතාවක් ඉන්දියාවට ගොස් රනිල් වික්‍රමසිංහ මහතා විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය ඉන්දියාවට පාවා දීම සඳහා හෙවත් ශ්‍රී ලංකාව ඉන්දියාවේ 29 වන ප්‍රාන්තය හෙවත් අර්ධ යටත් විජිතයක් බවට පත් කිරීම සහ ඉන් පසුව 30 වැනි ප්‍රාන්තය හෙවත් ඊළාම් රාජ්‍යය ද නිර්මාණය කිරීම සඳහා කැපවීමෙන් දායකවන ආකාරය මෙසේ දැක්විය හැක.**

### 1) 2002 ජුනි 11වැනි දින ඒකාබද්ධ ප්‍රකාශයක් මගින්...

1.1. ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පුළුල් කිරීම සහ එමගින් සේවා වෙළඳාම සඳහා අවස්ථාව සැලසීම.

1.2. ඉන්දු ශ්‍රී ලංකා ඒකාබද්ධ අධ්‍යයන කණ්ඩායම පිහිටුවීම මගින් ඉදිරි ගිවිසුම් සඳහා පදනම සකස් කිරීම.

1.3. ඉන්දියානු තෙල් සමාගම හෙවත් IOC සමාගමට ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සිල්ලර වෙළඳාම සඳහා අවස්ථාව ලබාදීම, ඉන්ධන හල් 100ක් ලබාදීම සහ ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය ලබාදීම සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.

1.4 ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලය දක්වා දුම්රිය මාර්ගයක් ඉදිකිරීම සඳහා මූලික අධ්‍යයනයට එකගවීම.

(එහිදී රනිල් වික්‍රමසිංහ මහතා මහතාට කණවැල ඇල්ලීම සඳහා පසු කාලීනව රනිල් වික්‍රමසිංහ මහතාට ජනාධිපති පුටුව පරිත්‍යාග කළ ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ඉන්දියාවේ ශ්‍රී ලංකා තානාපති ලෙස පත් කළ එවකට ආර්ථික කටයුතු අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා ද සහභාගී වීම විශේෂයකි. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති වීමට පෙර මිලින්ද මොරගොඩට ''සර්'' යනුවෙන් ආමන්ත්‍රණය කිරීම මගින් ඔහුගේ බලවත්කම පැහැදිලි වේ.)

## 2) 2003 ඔක්තෝබර් 21 දින ඒකාබද්ධ ප්‍රකාශය මගින්...

2.1. විස්තීර්ණ ආර්ථික සහයෝගීතා ගිවිසුම හෙවත් සීපා (CEPA) ගිවිසුම අත්සන් කිරීම මගින් සේවා වෙළඳාම සහ ඉන්දියානු ජාතිකයින්ට රට තුළට පැමිණ වෙළඳාම් කිරීම සහ රැකියා කිරීම සඳහා ඉඩ සැලසීමට එකඟ වීම. (පසුව ප්‍රබල මහජන විරෝධය හමුවේ එම ගිවිසුමේ නාමය ETCA ලෙස වෙනස් කරනු ලැබීය.)

2.2. සිවිල් ගුවන් සේවා (ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර) පුළුල් කිරීම මගින් යාපනය සහ මඩකලපුවට ඉන්දියාවේ සිට ඍජු ගුවන් ගමන් ආරම්භ කිරීම කිරීම. (ඒ සඳහා පසුකාලීනව මෙම ගුවන් තොටුපලවල් ගුවන් හමුදා පාලනයෙන් ඉවත්කර සිවිල් ගුවන් තොටුපළවල් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබීය.)

2.3. අවබෝධතා ගිවිසුමට අනුව ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය IOC සමාගමට බාරදීම.

2.4. ශ්‍රී ලංකාවේ ඊසාන දිග ගුවන් කලාපය ඉන්දියාවට පැවරීම. (මේ වන විට එම කලාපය තුළ පියාසර කරන ගුවන් යානාවලින් ඉන්දියාව අයකරගන්නා ගාස්තු ප්‍රමාණය ශ්‍රී ලංකාවේ රුපියල් වලින් මිලියන 6000ක් ඉක්මවා යන බව වාර්තා වේ.)

## 3) 2015 සැප්තැම්බර් 10 දින ඒකාබද්ධ ප්‍රකාශය මගින්...

3.1. ත්‍රිකුණාමලය වරාය කලාපය කණිජතෙල් කේන්ද්‍රයක් ලෙස සංවර්ධනය කිරීම. (ඒ මගින් වර්ෂයේ ඕනෑම කාලයක ක්‍රියාත්මක කළ හැකි ලෝකයේ 15 වැනි විශාලතම වරායට පය තබා ගැනීමට සහ කිලෝමීටර් 56ක මුහුදු තීරය භාවිතා කිරීමට ඉන්දියාවට දොර විවෘත විය)

3.2. නිදහස් වෙළඳ ගිවිසුමේ ගැටළු නිරාකරණය කිරීම සහ සීපා ගිවිසුමේ කටයුතු කඩිනම් කිරීම මගින් ඉන්දියානුවන්ට ශ්‍රී ලංකාවේ ආර්ථික ඉඩ ප්‍රස්ථා ලබාදීම.

## 4) 2016 ඔක්තෝබර් 6 දින ඒකාබද්ධ ප්‍රකාශය මගින්...

4.1. සේවා වෙළඳාම සහ ඉන්දියානුවන්ට ශ්‍රී ලංකාවේ රැකියා කිරීම සහ වෙළඳාම් කිරීම සඳහා ඉඩ සලසන එක්ක CEPA ගිවිසුමට අදාළ ඉදිරි කටයුතු සම්පූර්ණ කිරීම (පසුව එය ETCA ලෙස නම්කරනු ලැබීය.)

## 5) 2017 අප්‍රේල් 29 ඒකාබද්ධ ප්‍රකාශය මගින්...

5.1. ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ ඉන්දියාවට ඉඩප්‍රස්ථා වර්ධනය කෙරෙන ව්‍යාපෘති සඳහා ආර්ථික සහයෝගිතාව සඳහා වන ව්‍යාපෘති අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම.

5.2. IOC සමාගම විසින් බදු පදනම යටතේ ලබාගත් ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය ආශ්‍රිත ගැටළු නිරාකරණය කිරීම. (2014 දී මහින්ද රාජපක්ෂ පරාජය කිරීමේ 'රෙජීම් චේන්ජ්' මෙහෙයුමට පෙර මහින්ද රාජපක්ෂ රජය විසින් එම තෙල් ටැංකි සංකීර්ණය ඉන්දියානු සහ ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කළ යුතු බවට ඉන්දියාවට යෝජනා කළ අතර ඒ නිසා IOC ක්‍රියාකාරීත්වයට බාධා එල්ල විය.)

5.3. ඉන්දියානු ධීවරයන්ට කොන්දේසි සහිතව ශ්‍රී ලංකා මුහුදේ මසුන් මැරීමට හැකිවන ලෙස අදාළ ප්‍රශ්නය ගොඩින් බේරීම සඳහා අධ්‍යන කණ්ඩායමක් පත් කිරීම.

## 6) 2017 නොවැම්බර් 24 දින ඒකාබද්ධ ප්‍රකාශය මගින්...

6.1. ETCA ගිවිසුමට අදාළ කටයුතු අවසන් කිරීම.

## 7) 2018 ඔක්තෝබර් මස සිදු කළ චාරිකාවේ දී සාකච්ඡා කළ කරුණු....

7.1. 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම.

7.2. මත්තල ගුවන්තොටුපල කළමනාකරණය ඉන්දියාවට පැවරීම.

7.3. චීන රාජ්‍යය සමාගමකට ලබා දීමට තීරණය කර තිබූ උතුරු පළාතේ නිවාස ව්‍යාපෘතිය එම සමාගමට ලබා නොදී ඉන්දියානු සමාගමකට ලබාදීම.

## 8) 2023 දී 21 දින ඒකාබද්ධ ප්‍රකාශය මඟින්...

(මෙවර ඇතිකරගන්නා එකඟතාවය මීට පෙර අවස්ථා 7කදී ඇතිකරගත් එකඟතාවන්ගේ කූටප්‍රාප්තිය ලෙස සැලකිය හැක. එසේම මෙම එකඟතාව ඇතිකර ගැනීමට පෙර සංහිඳියා ක්‍රියාවලිය හෙවත් 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීමට අදාළව තමා විසින් ගනු ලබන ක්‍රියාමාර්ග සහ උතුරේ පක්ෂ සමඟ ඇතිකරගත් එකඟතාවය පිළිබඳව පැහැදිලි කරන අතර ඊට අදාලව ඉන්දියානු අගමැතිවරයාට ස්ථිරසාර පොරොන්දුවක් ලබා දුන් බවද වාර්තා විය. මෙවර ඇති කරගත් එකඟතාව ඉන්දු - ශ්‍රී ලංකා සම්බන්ධතා වර්ධනය කිරීමක් ලෙස හැඳින්වුවද ඒ මගින් අංගසම්පූර්ණ ආර්ථික ඒකාබද්ධකරණයක් ඇතිවන බව ඉතා පැහැදිලිය.)

### 8.1. සමුද්‍රීය සම්බන්ධතාවය -

ඒ යටතේ ත්‍රිකුණාමලය, කොළඹ සහ කන්කසන්තුරේ යන වරායවල්වල යටිතල පහසුකම් සංවර්ධනයට ඉන්දියාව දායකවන අතර එම වරායවල් ආශිතව ඉන්දියානු ක්‍රියාකාරීත්වය වර්ධනය කෙරෙනු ඇත. ඊට අමතරව ඉන්දියාවේ නාගපට්නම් සහ කන්කසන්තුරේ අතර මෙන්ම රාමේෂ්වරන් සහ තලේමන්නාරම අතර මගී බෝට්ටු සේවා ආරම්භ කෙරෙනු ඇත. ඒ මගින් උතුරු ප්‍රදේශයේ ඉන්දියානු ක්‍රියාකාරීත්වය වර්ධනය කෙරුණු ඇත.

### 8.2. ගුවන් සබඳතාවය -

ඒ යටතේ යාපනය සහ චෙන්නායි අතර ගුවන් සේවා වර්ධනය කිරීම සහ ත්‍රිකුණාමලය සහ මඩකලපුව අතර ගුවන් සබඳතා ආරම්භ කිරීම සඳහා ඉන්දියානු රජය ක්‍රියා කරනු ඇත. එසේම පලාලි ගුවන්තොටුපල සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කිරීම මගින් එහි ක්‍රියාකාරීත්වය තුළ ඉන්දියානු මැදිහත්වීම වර්ධනය කෙරෙන අතර මත්තල ගුවන් තොටුපොල සංවර්ධනය කිරීමේ නාමයෙන් එහි කළමනාකාරීත්වය ඉන්දියානු සමාගමක් යටතට පත් කිරීම ද අපේක්ෂා කෙරේ.

### 8.3. බලශක්තිය සහ විදුලිය ආශ්‍රිත සහයෝගීතාවය -

ඒ යටතේ ඉන්දියාවේ සිට නළ මාර්ගයෙන් ශ්‍රී ලංකාවට ඛනිජතෙල් සහ ගෑස් සැපයීම සඳහා නල මාර්ගයක් මුහුද යටින් එළීම සහ ඉන්දියානු සහ ශ්‍රී ලංකා විදුලි පද්ධති ඒකාබද්ධ කරමින් විදුලි කේබලයක් එළීම සිදුවේ. ඊට අමතරව පුනරින් සුළං බලාගාරය සහ සම්පූර් සූර්යබල ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ සුනිත්‍ය බල සැපයුම තුළ ඉන්දියානු මැදිහත්වීම වර්ධනය කරනු ඇත. ඒ අතර මන්නාරම් ද්‍රෝනියේ සහ කාවේරි ද්‍රෝනියේ මුහුදු ප්‍රදේශය තුළ ඛනිජතෙල් ගවේශණයද ඉන්දියානු සමාගම් වෙත ලබා දෙනු ඇත.

**8.4. වෙළඳ, ආර්ථික සහ මූල්‍ය සහයෝගීතාව -**

ඒ යටතේ ශ්‍රී ලංකාවේ රජය සතු ව්‍යාපාරවල ආයෝජනය කිරීම හෙවත් එම ආයතන සම්පූර්ණයෙන්ම හෝ ඒවායේ කොටස් ඉන්දියානු සමාගම් විසින් මිල දී ගැනීම සිදුවේ. ඒ අනුව ටෙලිකොම්, ශ්‍රී ලංකන් ගුවන් සමාගම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ලිට්රෝ ගෑස් ආදී ආයතන රාශියක් මිලදී ගැනීමට ඉදිරිපත් වන රටවල් හෝ සමාගම් අතුරින් ඉන්දියානු රජයේ හෝ පුද්ගලික සමාගම් වලට විශේෂ ප්‍රමුඛතාවයක් ලැබෙනු ඇත.

- ❖ ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුම හෙවත් ETCA ගිවිසුම අත්සන් කිරීම මගින් ශ්‍රී ලංකාවේ භාණ්ඩ සහ සේවා වෙළඳපල අත්පත්කර ගැනීමට අමතරව රට තුළට පැමිණ රැකියා කිරීමට සහ වෙළඳාම් කිරීමට ඉන්දියානුවන්ට හැකියාව ලැබෙන ඇත.

- ❖ ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සහ මූල්‍ය පහසුකම් ලබාදීම මගින් ශ්‍රී ලංකාවේ දත්ත පද්ධතිවලට ඇතුල්වීමේ හැකියාව ඉන්දියාවට ලැබෙනු ඇත.

- ❖ ඉන්දියානු රුපියල ශ්‍රී ලංකාව තුළ භාවිතා කිරීම හෙවත් මූල්‍ය ඒකාබද්ධකරණය

- ❖ ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිත ආයෝජන කලාපය තුළ ඉන්දියානු ආයෝජන වර්ධනය කිරීම මගින් ත්‍රිකුණාමලය ආශ්‍රිත ඉන්දියානු මැදිහත්වීම තවදුරටත් වර්ධනය කිරීමට හැකියාව ලැබෙනු ඇත.

  (මීට පෙර තිබුණාමළය ආශ්‍රිතව කණිජතෙල් පිරිපහදුවක් ආරම්භ කිරීම සහ ඉන්දියානු - ඇමෙරිකානු ඒකාබද්ධ යුද සැපයුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා සාකච්ඡා කෙරිනි. ඒ පිළිබඳව ඉන්දියානු විදේශ අමාත්‍යවරයා සහ ඇමරිකානු දෙවන රාජ්‍ය ලේකම් වික්ටෝරියා නූලන්ඩ් අතර ද සාකච්ඡා පැවැත්වූ බව වාර්තා විය.)

**8.5. පුද්ගල - පුද්ගල සහ භූගෝලීය සබඳතාවය -**

- ❖ ඒ යටතේ ඉන්දියානු දුම්රිය පද්ධතිය ත්‍රිකුණාමලය දක්වා දිගු කෙරෙන අතර එම ගොඩබිම් සබඳතාවය ජාත්‍යන්තර මාර්ගයක් බවට පත්වනු ඇත. ඊට සමගාමීව රාමේෂ්වරන් සිට තලේමන්නාරම දක්වා මහා මාර්ගයක් ඉදිරිකිරීම සඳහා යෝජනා ඉදිරිපත්වී ඇත.

- ❖ ශ්‍රී ලාංකිකයන්ගේ දඹදිව චාරිකාවට සමාන්තරව ඉන්දියානුවන්ගේ රාමායන චාරිකා සංවිධානය කිරීම මගින් වතුකරය සහ ඉන්දියාව අතර සබඳතාවය වර්ධනය කෙරෙනු ඇත.

- ❖ උඩරට කඳුකරයේ ඉන්දියානු ද්‍රවිඩ තරුණ පරපුර ඉලක්ක කරමින් කුසලතා පුහුණු මණ්ඩපයක් ඉදි කිරීම.

- ❖ උඩරට වතුකරයේ නිවාස ව්‍යාපෘති මගින් ඉන්දියානු සබඳතා වර්ධනය කිරීම.

- ❖ ඒ සියල්ලට අමතරව මීට පෙර බැසිල් රාජපක්ෂ ඉන්දියාවට ගොස් අත්සන් කළ ඉන්දියානු සහ ශ්‍රී ලංකා නාවික හමුදාව ඒකාබද්ධව ශ්‍රී ලංකාවේ සමුද්‍ර කලාප ආවේක්ෂණය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ සාකච්ඡා කෙරෙන බව දැන ගැනීමට ඇත.

- ❖ **ඒ අනුව 1987 ජුලි 29 දින ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා විසින් අත්සන් කළ ඉන්දු - ලංකා සාම ගිවිසුම මගින් අපේක්ෂා කළ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කූඨ ප්‍රාප්තිය ලෙස වසර 36කට පසුව 2023 ජුලි 21 ඇත්කරගත් එකඟතාවය සැළකිය හැක. ඒ ආකාරයට ඉහත සඳහන් කළ ආකාරයට ගිවිසුම් මගින් ශ්‍රී ලංකාව ඉන්දියාවේ අර්ධ යටත් විජිතයක් බවට පත්කිරීම සඳහා න්‍යාය ඉදිරිපත් කළ සර්ධාර් පනික්කාර්ගේ සිහිනය සැබෑ කිරීම හෙවත් ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය පාවාදීම සඳහා රනිල් වික්‍රමසිංහ මහතා විසින් ඉටුකරන භූමිකාව ඉතා හොඳින් තේරුම්ගත හැක.**

# දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය